## ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2017

---------------------------------------------------

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------- ---------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

-----------------------------------

(අ) සම්මේලනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවයේ ආරම්භක දිනයේ සිට එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප මත පදනම්ව රු.5,530,417 ක විශ්‍රාම ප්‍රතිලාභ වගකීමක් ගිණුම් ගත කර තිබුණද කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ පරිච්ඡේද 28 අනුව, විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම හඳුනාගෙන නොතිබුණි.

(ආ) පළාත් පාලන ආයතන සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම් මත සම්මේලනය මඟින් භාවිතයට ගනු ලබන පළාත් පාලන ආයතන වලට අයත් ක්‍රීඩාපිටිවල සංවර්ධන කටයුතු සඳහා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින් ඍජුවම දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් කරන ලද ඉදිකිරීම්වල වටිනාකම කල්බදු වත්කම් යටතේ සාවද්‍ය ලෙස ගිණුම් ගත කර එය මත විලම්භිත අයභාර බැරකම් වශයෙන් රු. 137,994,358 ක් ජංගම නොවන බැරකම් යටතේ දක්වා තිබුණි. මෙම අයභාර බැරකමින් රු. 8,291,439 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් රු.1,583,526 ක් අඩුවෙන් ක්ෂය කර තිබුණු බව විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව අනාවරණය වූ අතර කල්බදු වටිනාකම රු.9,900,000 ක් වූ වාහන දෙකකට අදාළව 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ක්ෂය ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.209,251 ක් වූ කල්බදු වගකීම ගිණුම්වලින් අත්හැරී තිබුණි

(ඉ) සම්මේලනයේ හිටපු මුදල් කළමනාකරු විසින් තරඟ විනිසුරුවන් ලෙස ව්‍යාජ නම් ඇතුළත් කර මුදල් ලබා ගෙන ඇති බව සමාලෝචිත වර්ෂයේදී සම්මේලනය විසින් සිදු කරන ලද පරීක්ෂණ වලදී අනාවරණය වී තිබුණි. මෙම මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරීක්ෂණ පවත්වන අතර වංචා කරන ලද මුළු මුදල් ප්‍රමාණය විගණිත දින වූ 2018 ජූලි 30 දින දක්වා අනාවරණය කර ගෙන නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා නොගත් අරමුදල් මාරු කිරීම් ලෙස රු.14,525,389 ක් සාවද්‍ය ලෙස ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබූ අතර මූල්‍ය ප්‍රකාශන මගින් මුදල් වංචාව පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) පහත සඳහන් ගිණුම් විෂයයන්ට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ලැබිය යුතු ගිණුම් | 1,363,696 | උපලේඛන හා ශේෂ සනාථන |
| (ii) | අනුග්‍රාහක ලැබිය යුතු මුදල් | 15,770,576 | |
| (iii) | වෙනත් ලැබිය යුතු ණය | 1,000,000 | |
| (iv) | රඳවාගත් අරමුදල් | 4,582,669 | උපලේඛන |
| (v) | අනෙකුත් ස්ථාවර වත්කම් | 102,797,212 | |
| (vi) | ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල | 41,720,741 | ඔප්පුව |
| (vii) | බැද්දගාන ගොඩනැගිල්ල | 29,521,436 | |
| (viii) | වාහන | 7,371,100 | ලියාපදිංචි සහතික හා භෞතික සත්‍යාපන වාර්තා |
| (ix) | කල්බදු වත්කම් | 135,865,740 | කල් බදු ගිවිසුම්,උපලේඛන |
| (x) | එයාටෙල් ලංකා සමාගම - තැන්පතු | 720,000 | තැන්පතු බිල්පත් හා ගිවිසුම් |
| (xi) | බැද්දගාන කායවර්ධන සංගමය - තැන්පතු | 150,000 | |
| (xii) | ස්ථාවර තැන්පතු | 1,663,569 | ස්ථාවර තැන්පතු සහතික |
| (xiii) | තොගය | 451,520 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (xiv) | වෙළඳ ලැබිය යුතු ශේෂ | 39,663,244 | කාල විශ්ලේෂණය |
| (xv) | වෙළඳ ගෙවිය යුතු ශේෂ | 29,269,919 | |

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.31,938,593 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,454,656 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,483,937 ක වර්ධනයක් පෙන්නුම්කර තිබුණි. මෙහෙයුම් ආදායම් රු.43,655,836 කින් අඩුවී තිබුණද මෙහෙයුම් වියදම් රු.52,883,384 කින් අඩුවී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. ශිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් ද මේ පිළිබඳ නිරීක්ෂණය කර තිබුණද 2017 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සම්මේලනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සම්මේලනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | සම්මේලනයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි අයවැය පාලනයක් ස්ථාපිත කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) | අත්තිකාරම් ගෙවීම් | අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොගැනීම, අත්තිකාරම් පාලනය හා අධීක්ෂණය නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොගැනීම හා වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු නොකිරීම. |
| (ඈ) | ගිණුම්කරණය | ජ'නල් සටහන් යෙදීමේදී ඒ සඳහා විධිමත් අධිකාරියක් යටතේ අනුමැතිය ලබා නොගැනීම. |